මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය
நிதி, திட்டமிடல் அமைச்சு
MINISTRY OF FINANCE AND PLANNING

මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01. இலங்கை
The Secretariat, Colombo 01. Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: 2484500, 2484600, 2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax: (94)- 11 - 2449823
වෙබ් අඩවිය / வெப்சைட் / Website: www.treasury.gov.lk

මගේ අංකය / எனது இல. / My No.: BD/HSP/124/1/2
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2013.06.24

අයවැය චක්‍රලේඛ අංක 161

ලේකම්, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
ලේකම්, සමාජ සේවා අමාත්‍යාංශය
ලේකම්, තැපැල් සේවා අමාත්‍යාංශය
සියළුම පලාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
සියළුම දිසාපතිවරුන්,
තැපැල්පති

## වයස අවුරුදු 70 ඉක්මවූ ජ්‍යෝෂ්ඨ පුරවැසියන් සඳහා ක්‍රියාත්මක රු. 1000/- ක සමාජ ආරක්ෂණ මාසික දීමනාව ලබාදීම

රජයේ වැඩිහිටි සුබසාධන ප්‍රතිපත්තිය යටතේ 2012 වසරේ අයවැය යෝජනාවක් අනුව, වයස අවුරුදු 70 ඉක්මවූ දිළිඳු එමෙන්ම, ස්ථිර ආර්ථික පදනමක් නොමැති ජ්‍යෝෂ්ඨ පුරවැසියන් හට රු.1,000/- ක මාසික දීමනාවක් ලබාදීමට තිරණය කෙරිනි. මෙමගින් රටේ ජ්‍යෝෂ්ඨ පුරවැසියන්ගේ ජීවන තත්වය ඉහළ මට්ටමකින් පවත්වාගෙන යෑම ද ඔවුන්ගේ සුබසාධනය වැඩිදියුණු කිරීම ද අපේක්ෂා කෙරේ.

02. රජයේ මෙම තිරණය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය උපදෙස් පහත චක්‍රලේඛ හා ලිපිවලින් සියළුම දිසාපතිවරුන් හා ප්‍රාදේශිය ලේකම්වරුන් මෙන්ම අදාල ආයතන දැනුවත් කර ඇත.

I. සමාජ සේවා අමාත්‍යාංශ ලේකම්ගේ අංක 2/2012 හා 2012.05.31 දිනැති චක්‍රලේඛය

II. රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ අංක HAF 3 - MISCL- 04 -002 හා 2012.06.25 දිනැති ලිපිය

III. සමාජ සේවා අමාත්‍යාංශ ලේකම්ගේ අංක MSS/3/2/2වැ.ලේ/12 හා 2012.11.18 දින දරන ලිපිය

IV. සමාජ සේවා අමාත්‍යාංශ ලේකම්ගේ අංක 01/2013 හා 2013.04.19 දිනැති චක්‍රලේඛය

03. ඉහත චක්‍රලේඛ වලින් සුදුසුකම් ලබන වයස අවුරුදු 70 ඉක්මවූ ජ්‍යෝෂ්ඨ පුරවැසියන් මෙම රු.1,000/- ක දීමනාව ලබාගැනීමට හිමිකම ලබන අතර, අදාල පුරවැසියා සමෘද්ධි හෝ පලාත් සභා හෝ

වෙනත් රජයේ ආයතනයක් විසින් ක්‍රියාත්මක කරනු ලබන සුබසාධන ආධාර වැඩසටහනක් යටතේ යම් ප්‍රතිලාභයක් ලබන්නේ නම්, එම ප්‍රතිලාභයට අමතරව මෙම රු.1,000/- ක වැඩිහිටි ආරක්ෂණ දීමනාව ලබා ගැනීමට හිමිකම ලබයි.

04. මෙම වැඩසටහන හා සම්බන්ධ අනෙකුත් ප්‍රාදේශීය නිලධාරීන් ද මේ පිළිබඳව දැනුවත් කර වැඩිහිටි සුබසාධනය අරමුණු කරගත් රු.1,000/- ක වැඩිහිටි ආරක්ෂණ දීමනාව බාධාවකින් තොරව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස වැඩිදුරටත් දන්වා සිටිමි.

පී.බී.ජයසුන්දර
මහා භාණ්ඩාගාරයේ ලේකම් හා
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ලේකම්

පිටපත්:
1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩල ලේකම්
4. විගණකාධිපති